**වී අලෙවි මණ්ඩලය පිළිබඳ ගනුදෙනු පිළිබඳව වාර්තාව -2021**

-----------------------------------------------------------------------

වී අලෙවි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමග ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුලත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

-------------------

**2.1 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්**

--------------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| <u>වත්කම්</u> | රු. |
| ජංගම නොවන වත්කම් | 1,569,049,227 |
| ජංගම වත්කම් | 6,501,271,386 |
| මුළු වත්කම් | <u>8,070,320,613</u> |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | (14,179,929,345) |
| <u>වගකීම්</u> | |
| ජංගම බැරකම් | 10,049,541,444 |

| | |
|---|---|
| ජංගම නොවන බැරකම් | 12,200,708,514 |
| මුළු බැරකම් | (22,250,249,958) |
| | -------------------- |
| මුළු බැරකම්/හිමිකම් | 8,070,320,613 |
| මුළු ආදායම | 396,551,485 |
| මුළු වියදම | 1,281,334,002 |
| | ------------------- |
| ඌනතාවය | 884,782,517 |

**2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 257 හා 139 (8,10) | ගෙවීම සඳහා ගෙවන නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීමට පෙර සියලුම වවුචර් සහතික කොට තිබිය යුතු අතර, සෑම ගෙවීමක්ම නියමිත ලේඛණවල සටහන් කරන බව හා ගිණුම්ගත කරන බව ද, මුදල් පොතේ ශේෂය නිසි වාරාන්තර අනුව බැංකු ප්‍රකාශය හා සසඳන බවට ද ගෙවීමේ නිලධාරියා වගකිව යුතු වුවද එලෙස ක්‍රියාකර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 395 | බැංකු ගිණුමක් ඇති සෑම අස්ථිත්වයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කළ යුතු වුවද මණ්ඩලය 2020 වර්ෂයේ සිටම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |

**2.3 අත්තිකාරම් පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අත්තිකාරම් ලේඛනය අනුව 2016 වර්ෂයේ සිට 2022 වර්ෂ දක්වා ලබා දුන් අත්තිකාරම් වලින් 2022 සැප්තැම්බර් 13 දින වන විට රු.1,059,115 ක අත්තිකාරම් පියවා නොතිබුණි. ඒ තුල 2016 වර්ෂයේ සිට පැවත එන රු.60,000 ක්ද, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂ දක්වා වූ රු.611,415 ක ශේෂයක්ද පැවතුණි.

(ආ) මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2015 අප්‍රේල් 22 දිනැති අංක PMB/F1/14/2015 දරන අභ්‍යන්තර " මැමය'' මගින් රාජකාරි කටයුතු සඳහා ලබා ගන්නා අත්තිකාරම් ලබා ගන්නා දිනයේ සිට දින 07 ක් ඇතුලත පියවීම සිදු කල යුතු වුවද ඉහත අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) වී අලෙවි මණ්ඩලයේ විවිධ තනතුරු දරන නිලධාරින් 19 දෙනෙකු 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා විනය විරෝධි කරුණු මත අනිවාර්යය නිවාඩු යැවීම් සහ වැඩ තහනමට ලක් කිරීම් සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් විනය පරික්ෂණ ආරම්භ කර වසර 01 ක සිට වර්ෂ 07 ක් දක්වා කාලයක් ගත වි තිබුණ ද එම පරික්ෂණ නිම වී නොතිබුණි. ඒ පිළිබඳ වැඩිදුර පරීක්ෂා කිරිමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිගේ අක්‍රමිකතා නිසා මණ්ඩලයට සිදු වු රු.312,662,925 ක පාඩුව හේතුවෙන් 2015 මාර්තු 20 දින වැඩතහනමට ලක් කර තිබුණු අතර ඔහුට විරුද්ධව ඇති චෝදනා 77 කි. 2015 වර්ෂයේ සිට 2022 අගෝස්තු මාසය වන විට වසර 7 කට අධික කාලයක් ගත වි තිබුණ ද පරික්ෂණ අවසන් කර මණ්ඩලයට සිදු වු අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මෙහෙයුම් වී අලෙවි මණ්ඩලයට රු.112,500,000 ක අලාභ සිදු කිරීමට චෝදනා 14 ක් වූයෙන් 2019 මැයි 08 වන දින අනිවාර්ය නිවාඩු යවා ඇති අතර, 2020 ජනවාරි 7 දින නැවත සේවයේ පිහිටුවා තිබුණ ද 2021 ජනවාරි 25 දින නැවත වරක් අනිවාර්යය නිවාඩු යවා තිබුණි. එසේ වුවද, විගණිත දිනය දක්වා විමර්ශන සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) නිලධාරින් තිදෙනෙකු අනිවාර්ය නිවාඩු යවා වැටුප් ගෙවීම සිදුකරන අතර මෙම විමර්ශන වර්ෂ 02 කට අධික කාලයක් ගත වී ඇතත් එම විමර්ශන කටයුතු කඩිනමින් අවසන් නොකිරීම නිසා නිලධාරින්ට වැටුප් ලෙස රු.7,306,327 ක් ගෙවා තිබුණි.

(iv) වී ගබඩා වල වී තොග සමික්ෂනයේ දි අනාවරණය වු වී තොග අඩුවීම හේතුවෙන් නිලධාරින් දෙදෙනෙකුට චෝදනා ඉදිරිපත් වී තිබුණ ද එම නිලධාරීන් දැනට සේවයේ නියුතු අතර විගණන දිනය වන 2022 ඔක්තෝම්බර් 10 දින වන විටත් ඔවුන්ගේ මූලික විමර්ශන ද අවසන් වී නොතිබුණි.

(v) විධිමත් විනය පරික්ෂණ පවත්වා විනය ක්‍රියාමාර්ග අවසන් කර ඇති නිලධාරින් පස් දෙනෙකුගෙන් මණ්ඩලයට රු.41,749,524 ක් අය කරගත යුතු ලෙස දක්වා තිබුණ ද ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(vi) 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කඩිනමින් විනය පරික්ෂණ අවසන් කල යුතු වුවද, විගණන දිනය වන 2022 සැප්තැම්බර් 06 දින වන විටත් නිලධාරීන් 19 දෙනෙකුට විරුද්ධව පැවත්විය යුතු විනය පරීක්ෂණ ඇනහිට තිබූ අතර විනය පරික්ෂණය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** වී අලෙවි මණ්ඩලය සතුව පවතින වාහන 13 න් වාහන 03 ක් පමණක් ධාවන තත්ත්වයේ පවතින අතර ධාවන තත්ත්වයේ නොපවතින වාහන 10 යෙන් වාහන 04 ක් අළුත්වැඩියා කිරීමට නියමිතව වසර 02 ක සිට විවිධ ස්ථානවල ගාල්කර තිබුණද 2020 ඔක්තෝම්බර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද ධාවනයට ගත නොහැකි අබලන් වාහන ද ඉහත චක්‍රලේඛයේ (අ) ඡේදය ප්‍රකාරව අපහරණය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2019/2020 මහ කන්නයේ වී මිල දී ගැනිමේ වැඩසටහන යටතේ වී මිල දි ගැනීම සඳහා රුපියල් මිලියන 4780 ක් ඔඩපණ ණය ලෙස ලංකා බැංකුව, මහජන බැංකුව හා ප්‍රාදේශිය සංවර්ධන බැංකුවෙන් වී අලෙවි මණ්ඩලය ණය ලබා ගෙන තිබුණි. එම මුදල් භාවිතා කර දිස්ත්‍රික් ලේකම්වරුන් කුඩා වී මොල් හිමියන් හරහා වී මිල දි ගැනීම සිදුකර තිබු අතර මණ්ඩලය විසින් ද වී මිල දී ගැනීම සිදු කර තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරුන් සඳහා වී මිලදි ගැනීමට රු.1,897,000,000 ක් හා මෙහෙයුම් වියදම් සඳහා රු.3,462,525 ක් ලබා දී තිබුණු අතර ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දිස්ත්‍රික් ලේකම්වරුන්ට මුදල් ලබාදිමේදී ඒ සඳහා ගිවිසුමකට හෝ ණය මුදල් හැකි ඉක්මනින් පියවීමට අදාල කොන්දේසි වලට එකඟ වී නොතිබුණි. ඒ අනුව විකුණා ලැබෙන මුදල් ප්‍රමාදයකින් තොරව පියවීමට හා මිල දී ගත් මුදලට වඩා වැඩි මිලට විකුණු අවස්ථා වලදී එම ලාභය මණ්ඩලයට ලබා ගත හැකි වන අයුරින් ක්‍රමවේදයන් සකස් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. එසේ වුවද දිස්ත්‍රික් ලේකම්වරුන් 05 දෙනෙකු පමණක් ලබාදුන් මුදලින් මිල දි ගත් වී වැඩි මිලට විකිණිමෙන් ලද ලාභය වූ රු.20,671,012 ක් මණ්ඩලය වෙත පියවා තිබුණි.

(ii) දිස්ත්‍රික්ක 16 ක දිස්ත්‍රික් ලේකම්වරුන්ට වී මිලදි ගැනීමට ලබාදුන් මුදලින් එනම් සියයට 69 ක් පමණක් වී මිලදි ගෙන තිබුණු අතර ඉතිරි සියයට 31 වූ රු.592,170,678 ක මුදල් ආපසු එවා තිබුණි. එම මුදල් එවිමට මාස 2 ½ සිට මාස 8 ක කාලයක් ප්‍රමාද විම නිසා මණ්ඩලය ලබාගත් ණය මුදල් සඳහා බැංකුවට ගෙවීමට සිදු වන පොලිය රු.10,695,492 ක් විය. නිසි සැලැස්මක් නොමැති වීම හේතුවෙන් පොළි මත ලබාගත් ණය මුදල් නිසි පරිදි උපයෝජනය නොකිරීමෙන් ගෙවීමට සිදුවන පොළිය නිශ්කාර්ය වියදමක් ලෙස විගණනයට නිරීක්ෂණය විය.

(ආ) 2019/20 මහ කන්නයේ වී මිල දී ගැනීමට මණ්ඩලය ලබාගත් ණය මුදල රු.4,780,000,000 ක් විය. ඒ සඳහා 2022 සැප්තැම්බර් 14 දින වන විට රු.4,020,915,545 ක් පියවා තිබු අතර වසර 02 ක කාලයක සිට ණය පියවිම නිසා ගෙවීමට සිදු වූ පොලිය රු.381,758,768 ක් විය. එය ණයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.49 ක් විය. එසේ වුවද විගණිත දිනය වන 2022 සැප්තැම්බර් 10 දින වන විටත් ණය මුදලෙන් රු.759,084,455 ක් ගෙවීමට තිබුණු අතර 2022 සැප්තැම්බර් 14 දිනට ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු.31,112,064 ක් වන අතර පොලි ගෙවිම ප්‍රමාද විම නිසා 2022 සැප්තැම්බර් 14 දිනට බැංකුවට ගෙවිමට සිදුවන දඩ ගාස්තු රු.923,076 ක් විය.

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වී ගබඩා වැඩි දියුණු කිරීම හා නවීකරණය සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 175 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.5 ක් පමණක් වැය කර වී ගබඩා 35 ක් නවීකරණය කිරීම පමණක් සිදුකර තිබුණි. නවීකරණය කරන ලද ගබඩාවන්ගෙන් ගබඩා 07 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එහි ධාරිතාවය මෙට්‍රික් ටොන් 7100 ක් වුවද ගබඩා කර තිබුණේ මෙට්‍රික් ටොන් 561 ක් පමණක් වූයෙන් එම ධාරිතාවයෙන් ද සියයට 92 ක් ම ඌන උපයෝජිතව පැවතුණි.

**(ආ)** වී අලෙවි මණ්ඩලය සතු මුළු ගබඩා ධාරිතාවය මෙ.ටො.317,530 ක් වූ අතර, 2020/21 මහ කන්නයේ මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය මෙ.ටො.300,000 ක් වුවද මිලදී ගෙන තිබුණේ මෙ.ටො.45,124 ක් වූයෙන් ගබඩා ධාරිතාවයෙන් සියයට 14 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**(ඇ)** 2021 යල කන්නයේ මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය මෙ.ටො. 50,000 වූ අතර මිල දී ගෙන තිබුණේ මෙට්‍රික් ටොන් 7,728 ක් වූයෙන් ගබඩා ධාරිතාවයෙන් සියයට 2.4 ක් පමණක් උපයෝජනය කර තිබුණි.